**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව - 2022**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 2,692,496 ක හිඟ විශ්‍රාම වැටුප් දායක මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව. | වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද එකතු වටිනාකම රු. 9,586,062 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි නවීකරණය කිරීමේ වියදම් ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු. 62,915,634 ක වියදමින් ඉදිකර සභාව වෙත පවරාදුන් පන්නෙගමුව නව සතිපොළ ගොඩනැගිල්ල ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.935,476 ක කර්මාන්ත ආධාර ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව. | ණයගැතියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය . |
| (ඉ) | ඉකුත් වර්ෂයේදී ඇල්ලගල ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ලද රු.899,975 ක මුදල සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව. | ප්‍රතිපූර්ණය කරන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂයේදී දෙබරවැව පොදු ක්‍රීඩාංගනයේ ක්‍රීඩක විවේකාගාරය ඉදිකිරීමේ රු.1,773,936 ක ණයහිමි ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව. | ගෙවීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (උ) | 2020 වර්ෂයේදී කඩ කාමර බදු දීමේදී අයකළ රු. 1,570,000 ක එක්වන් මුදල් ආදායමක් ලෙස ගිණුම්ගත නොකර කඩ කුලී තැන්පතු ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී මාගම්පත්තු පුරාණය නැමති ග්‍රන්ථය අලෙවියෙන් ලද රු. 67,000 ක් ආදායම විවිධ තැන්පත් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | සභාවේ පුස්තකාල පාඨකයින්ගෙන් අයකරනු ලබන ආපසු නොගෙවන තැන්පත් රු. 168,420 ක් පුස්තකාල තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | ඉකුත් හා සමාලෝචිත වර්ෂයේ විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම මත ප්‍රතිපූර්ණය නොවන වීථි පහන් නඩත්තු ගාස්තු රු.469,777 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය සඳහා සියයට එකේ (1%) බදු ආදායම බිල් කිරීමේදී හෝටල් 02 කින් ලැබියයුතු රු. 258,006 ක් බිල්කර නොතිබීමෙන් බදු ආදායම අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | ආදායම් නිවැරදිව බිල්කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 3,995,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ක) | 2015 හා 2017 වර්ෂයන් වලදී ලද එකතුව රු.337,994 ක් වූ අගරු චෙක්පත් දෙකකට අදාළ පාර්ශවයන් හඳුනාගෙන ණයගැතියන් යටතේ ගිණුම්ගත නොකර අගරු චෙක්පත් ගිණුමකට හර කර තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ග) | 2023 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වියදම් කළ රු. 310,561 ක මුදල වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව. | වර්ෂයට අදාළ වියදම් පමණක් වර්ෂය තුළ ගිණුම්ගත කළ යුතුය. |
| (ජ) | 2018 හා 2019 වර්ෂවල මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීම වෙනුවෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට ගෙවීම් කළ රු.79,200 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව. | වර්ෂයට අදාළ වියදම් පමණක් වර්ෂය තුළ ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලාා ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 84,737,038 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුවෙහි රු. 436,323 ක වෙනසක් විය. | ඉදිරි වර්ෂයට අදාල ලැබීම් වර්ෂයේ ලැබීම් ලෙස දැක්වීම වෙනසට හේතු වූ බවත්, ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවැති හිඟ ප්‍රාග්ධන ආදායම් රු. 1,894,757 කට අදාළව උපලේඛනය හා කාල විශ්ලේෂණය ඉදිරිපත් නොවුණි. | ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 134 (2) වගන්තිය | සභාවට අයත් වරිපනම් සීමාව පුළුල් කිරීම සඳහා 2013 හා 2018 යන වර්ෂයන් වලදී ග්‍රාම නිලධාරී වසම් 10 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබුණත් එම ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 වසරේ සිට වරිපනම් දියුණු කළ ප්‍රදේශ නම් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ 20 වන වගන්තිය | වරිපනම් දේපල වසර 05කට වරක් තක්සේරු කළ යුතු වුවත් එපරිදි කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදීත්, 2007 වර්ෂයේ තක්සේරුව මත බදු අය කරමින් පැවතුණි. | වරිපනම් දේපල තක්සේරු කරවීමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කළ බව. | ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 33, 34 හා 35 | වරිපනම් බදු ගෙවීම පැහැර හරින පුද්ගලයන් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බදු ගෙවීම පැහැර හරින පුද්ගලයින් පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | 2012 හා 2013 වර්ෂයේදී සභාවේ නිලධාරීන්ට ලබාදී තිබූ රු.97,667 ක අත්තිකාරම් පියවා නොතිබුණු අතර හිඟය තුළ හඳුනා නොගත් රු. 57,771 ක ශේෂයක් විය. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ IV ඡේදය | 2022 වර්ෂයේ ඔක්තෝබර් 06 දින දක්වා රු. 157,380 ක නිවාඩු දින වැටුප් ගෙවීම් කිරීමේදී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ධාවන සටහන් මගින් එකී නිවාඩු දින වල සේවයට පැමිණීම පිටවීම සනාථ කර ගත් බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,342,531 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,194,804 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,132,086 | 3,144,139 | 3,458,490 | 4,644,329 | 3,500,690 | 3,653,246 | 2,160,998 | 4,958,680 |
| කුලී | 15,139,002 | 14,083,204 | 14,810,927 | 8,123,748 | 16,050,100 | 15,106,015 | 5,838,550 | 8,851,471 |
| බලපත්‍ර ගාස්තු | 5,207,392 | 8,819,563 | 9,384,628 | 914,986 | 8,187,000 | 6,974,153 | 5,676,453 | 1,480,050 |
| වෙනත් ආදායම් | 12,249,876 | 11,661,818 | 11,360,192 | 1,307,427 | 9,606,876 | 11,761,599 | 11,439,877 | 1,005,801 |
| **එකතුව** | **35,728,356** | **37,708,724** | **39,014,237** | **14,990,490** | **37,344,666** | **37,495,013** | **25,115,878** | **16,296,002** |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 3704 කින් ලැබිය යුතු වරිපනම් බදු රු. 3,814,028 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට සහ නොගෙවන අයට රතු නිවේදන නිකුත් කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර හා කර්මාන්ත ඒකක 229 කින් ලැබිය යුතු ව්‍යාපාර හා කර්මාන්ත බදු රු. 534,360 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ඉකුත් වර්ෂයට අදාළ විනෝද බදු රු. 295,940 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟය අය කර ගැනීම සඳහා නඩු පැවරූ බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 330 කින් ලැබිය යුතු කඩ කුලී රු. 6,326,815 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ නොගෙවන කඩ හිමියන් සඳහා නීතිමය කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සතිපොළ 03 කින් ලැබිය යුතු පොළ බදු කුලී රු.1,657,590 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.775,455 ක් කපාහැරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමුකළ අතර ඉතිරි හිඟ ආරක්ෂිත ඇප තැන්පතු වලින් අයකර ගැනිමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඊ) | සභාව විසින් බදුකරුවන් සමඟ අත්සන් කළ ගිවිසුමේ කොන්දේසි කඩකරමින් සභාව සතු තිස්ස නගර සභා කඩ කාමර 07 ක් අතුරු බදු දී තිබුණද ගිවිසුම කඩකල බදුකරුවන් සම්බන්ධයෙන් සහා කළමණාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | සෑම ගිවිසුමක්ම වසර තුනකට වරක් යාවත්කාලීන කළ යුතු වුවත් සභාව සතු කඩකාමර 140 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණු අතර ගිවිසුම් යාවත්කාලීන නොකරන ලද කාල පරාසය වසර 02 ත් 31 ත් අතර විය. | ඉදිරියේ දි ජංගම වැඩසටහන් පවත්වා ගිවිසුම් අත්සන් කර ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාහන කුලී ආදායම් රු. 337,400 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර හිඟයෙන් රු. 311,400 ක් 2014 වර්ෂයට අදාළ විය. | හිඟ මුදල් අය කිරීම සඳහා නීතිමය පියවර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කසල ඉවත් කිරීමේ ගාස්තු රු. 364,750 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර හිඟයෙන් රු. 334,750 ක් ඉකුත් වර්ෂයට අදාළ විය. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඒ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,133,287 ක් හා රු. 7,970,592 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විවිධ කර්මාන්ත සඳහා ලබාදුන් පරිසර ආරක්ෂණ බලපත්‍ර 59 ක වලංගු කාලය ඉක්මවා ගොස් තිබූ අතර එම බලපත්‍ර අලුත් කිරීමට ක්‍රියාමාර්ග නොගැනීම නිසා සභාවට 2022 වර්ෂය තුළ අහිමි වූ ආදායම රු. 177,000 ක් විය. | කර්මාන්ත හිමියන් කඩිනමින් බලපත්‍ර ලබා ගැනීමට යොමු කිරීමට අවශ්‍ය කටයුතුසිදු කරන බව. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සභාව භාවිතයට ගනු ලබන වාහන 06 ක ලියාපදිංචි අයිතිය සහ ඉඩම් හා ගොඩනැගිලි 72 ක නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි 28 ක් පවරා ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් යොමු කළ බවත්, ඉතිරි දේපල පවරා ගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | 2012 වර්ෂයත් සමාලෝචිත වර්ෂයත් අතර ධාවනයෙන් ඉවත් කළ වාහන 11 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | ධාවනයෙන් ඉවත් කළ වාහන අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය, ගල් ක්‍රෂර් යන්ත්‍රය සහ කිලෝ 50 ක ධාරිතාවක් ඇති බෝල් වීල් යන්ත්‍ර 02 ක් දීර්ඝ කාලයක සිට නිශ්කාර්යව පවතින අතර ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය, ගල් ක්‍රෂර් යන්ත්‍රය වෙන්දේසි කිරීමට සහ කිලෝ 50 ක ධාරිතාව ඇති බෝල් වීල් යන්ත්‍ර 02 ක මැටි කර්මාන්තය සඳහා ලබාදීමට ඉදිරියේදී කටයුතු කරන බව. | නිශ්කාර්යව පවතින වත්කම් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෘජු ශ්‍රම පදනම මත ඉටු කිරීමේදී නිම්වැඩ වටිනාකමින් සියයට 20 ක් සභාවේ ඉතිරි නොවීම මත කර්මාන්තය සෘජු ශ්‍රම පදනමින් ක්‍රියාත්මක කිරීම නිසා රු. 691,537 ක් සභා අරමුදලට පාඩු වී තිබුණි. | කර්මාන්තය සෘජු ශ්‍රමික පදනම මත ඉටුකිරීම සඳහා සභාවේ අනුමැතිය ලද බව. | සෘජු ශ්‍රම පදනම මත කර්මාන්ත ඉටු කිරීමේදී නිම්වැඩ වටිනාකමින් සියයට 20 ක් සභාවේ ඉතිරි කරගත යුතුය. |
| (ආ) | පන්නෙගමුව ගොවිසෙවන ක්‍රීඩාංගනය වටා විදුලි පහන් කණු 08 ක් ස්ථාපිත කිරීමේ කර්මාන්තය සභාව මඟින් ඉටුකිරීම සඳහා සභා අරමුදලින් රු. 907,650 ක් වැයකර ඉදිකිරීමේ ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් විදුලි කණු 08 ස්ථාපිත කර නොතිබුණි. මේ සඳහා සභා අරමුදලින් රු.32,200 ක් වැයකර මිලදීගත් භාණ්ඩ අදාළ කාර්යය සඳහා යොදා නොගෙන පෞද්ගලිකව පරිහරණය කර තිබුණි. | අඩි 27 විදුලි කණු 04 ක් ස්ථාපිත කිරීමට ඇස්තමේන්තු සකස් කර ද්‍රව්‍ය ලබාගත් පසු අඩි 57 විදුලි කණු 04 ක්ද සකස් කිරීමට සිදුවුයෙන් කාර්යය සිදුකිරීම ප්‍රමාද වූ අතර පෞද්ගලික පරිහරණයට නොගෙන වෙනත් කර්මාන්තයක් සඳහා භාවිතා කළ බව. | කර්මාන්ත අදාළ කාල සීමාව තුළ නිම කළ යුතු අතර අදාළ කාරණ විධිමත් පරිදි ඉටුකළ යුතුය. |
| (ඇ) | ඇල්ලගල ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර රු. 1,415,975 ක් ගෙවීම් කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සභාව වෙත ප්‍රතිපූර්ණය කර තිබූ මුදලට වඩා රු.306,025 ක් සභා අරමුදලින් වැඩිපුර ගෙවා තිබුණි. පස් ප්‍රවාහනය වෙනුවෙන් හා එස්කැවේටර් යන්ත්‍රය ප්‍රවාහන කුලී වෙනුවෙන් රු.128,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. මුදල් රෙගුලාසි 260 (1) පටහැනිව වාහන කුලී ලෙස රු.1,276,000 ක් එම සේවාව සැපයූ පෞද්ගලික ආයතනයට ගෙවීමට කටයුතු නොකර සභාවේ කාර්මික නිලධාරි වෙත ගෙවීම් කර තිබුණි. | ඉතිරි මුදල ප්‍රතිපූර්ණ කර ගැනීම සඳහා සිහි කැඳවීම් ලිපි යොමුකළ අතර නිම් වැඩ වාර්තාව සකස් කිරීමේදී අතපසුවීමක් සිදු වූ බව හා ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොකිරීමට කටයුතු කරන බව. | වැඩිපුර කළ ගෙවීම් වගකිවයුතු පුද්ගලයන් ගෙන් නැවත අයකරගත යුතු අතර, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන යටතේ පන්නෙගමුව ගොවිසෙවන ක්‍රීඩාංගනයේ දැල්වැට ඉදිකිරීම කර්මාන්තය සෘජු ශ්‍රම පදනම මත සභාව විසින් ක්‍රියාත්මක කර රු.1,549,500 ක නිමිවැඩ වාර්තාවක් සකස් කර රු.1,353,907 ක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. මෙම කර්මාන්තය සෘජු ශ්‍රම පදනම මත ඉටුකිරීමෙන් රු. 343,800 ක් සභා අරමුදලට පාඩු වී තිබුණි. මෙම කර්මාන්තය යටතේ රු.58,100 ක් වැය කර මිලදී ගෙන තිබූ ද්‍රව්‍ය කාර්මික නිළධාරී විසින් දැල් වැට ඉදිකිරීම සඳහා යොදාගෙන නොතිබුණි. | ඇස්තමේන්තුගත වැටෙහි ප්‍රමාණයට වඩා නිමකළ වැටෙහි දිග ප්‍රමාණය වැඩි වුයෙන් වැඩි මුදලක් වැය කළ බව හා මිලදී ගෙන ඇති ද්‍රව්‍ය මේ වනවිට ගබඩාව වෙත භාර දී ඇති බව. | සෘජු ශ්‍රම පදනම මත කර්මාන්ත ඉටු කිරීමේදී නිමිවැඩ වටිනාකමින් සියයට 20 ක් සභාවේ ඉතිරි කරගත යුතු අතර කර්මාන්තය සඳහා අවශ්‍ය භාණ්ඩ පමණක් මිලදීගත යුතුය. |
| (ඉ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින ක්‍රීඩාපිටි හා සුසාන භූමි 20 ක යන්ත්‍ර භාවිතා කර කැලය ඉවත් කිරීම වෙනුවෙන් කාර්මික නිලධාරී විසින් ඇස්තමේන්තු හා නිමි වැඩ වාර්තා සකස් නොකර රු.1,285,200 ක් හා යන්ත්‍ර ප්‍රවාහනය වෙනුවෙන් රු.84,340 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පිළිගන්නා බව හා ඉදිරියේ දි මෙවැනි අඩුපාඩු නොවීමට කටයුතු කරන බව . | කර්මාන්තය සඳහා සකස් කළ ඇස්තමේන්තු හා නිමි වැඩ වාර්තා මත ගෙවීම් කළ යුතුය. |
| (ඊ) | සභා අරමුදලින් සෘජු ශ්‍රම පදනම මත අකුරුගොඩ නිලනිවාසය වටා දැල්වැට ඉදිකිරීමේ කර්මාන්තය යටතේ PVC දැල්වැට මීටර 180 ක් දිගට සකස් කිරීම සිදුකල බව දක්වමින් රු. 727,709 ක් භාණ්ඩ මිලදී ගැනීමට හා රු.19,600 ක් ශ්‍රමික කුලී ලෙස එකතුව රු.747,309 ක වියදමක් දරා තිබුණි. PVC දැල්වැට මීටර 102 ක් පමණක් ඉදිකර තිබීමෙන් මෙම කර්මාන්තය සඳහා වැඩිපුර රු.323,833 ක් ගෙවීම් කර තිබුණි. | මෙම කර්මාන්තය ලිපිගොනු දෙකකින් ක්‍රියාත්මක කර භාණ්ඩ මිලදීගෙන වෙනත් කර්මාන්තයකට භාවිතා කළ බව. | වැඩිපුර කළ ගෙවීම් වගකිව යුතු පුද්ගලයන් ගෙන් නැවත අයකරගත යුතුය. |
| (උ) | පන්නෙගමුව සතිපොළ භූමිය සංවර්ධනය සඳහා රු.1,125,216 ක් සභාව විසින් වැයකර තිබූ අතර එම වියදම තුළ දින 51ක් සඳහා රු.102,000 ක් වැඩිපුර ශ්‍රමය සඳහා කුලී ගෙවා තිබුණි. | ගෙවිය යුතු කුළිය ඉක්මවා ගෙවීම් නොකළ බව. | වැඩිපුර කළ ගෙවීම් වගකිව යුතු පුද්ගලයන් ගෙන් නැවත අයකරගත යුතුය. |
| (ඌ) | මහජන ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම -2021 වැඩසටහන යටතේ දෙබරවැව පොදු ක්‍රීඩාංගනයේ ක්‍රීඩක විවේකාගාරය ඉදිකිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අතරුදවුම් මුදල් අඩුකර රු.3,716,971ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම්කර තිබුණි. ගොඩනැගිල්ලට ජල සම්බන්ධතාවය ලබාදීම සඳහා රු. 60,614 ක් වැඩිපුර හා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.2 අනුකූළ නොවන ලෙස රු.169,599 ක් මිල විචලනයන් සඳහාද ගෙවීම් කර තිබුණි. | කර්මාන්තය සඳහා අත රැඳවුම් මුදල් ලැබීමෙන් පසුව මෙම මුදල පියවා ගැනිමට කටයුතු කරන බව. | වැඩිපුර කළ ගෙවීම් වගකිවයුතු පුද්ගලයන් ගෙන් නැවත අයකරගත යුතුය. |
| (එ) | පන්නෙගමුව ආලෝක මාවත ආරම්භයේ සිට ජයවර්ධන මහතාගේ නිවස දක්වා වූ මාර්ගයෙහි අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇතිරීම සඳහා වූ | අවස්ථා දෙකෙහිදීම තත්ත්ව පරීක්ෂාව මාර්ග සංවර්ධන අධිකාරියෙන් සිදුකළද ලබාදුන් | නියමිත ප්‍රමිතියට අනුකූලව ඉදිකිරීම් කටයුතු සිදු කළ යුතුය. එසේ නොමැතිනම් |

| | | |
|---|---|---|
| කර්මාන්තයේ අන්තර් සම්බන්ධිත කුට්ටිගල්වල අගය නියමිත ශක්තියෙන් තොරව ගෙවීම් කිරීම නිසා දරන ලද රු. 1,731,840 ක් වූ වියදම ඵලදායි නොවන ගෙවීමක් වූයෙන් ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගයන් සභා කළමනාකාරීත්වය විසින් සමාලෝචිත වර්ෂයේදීත් ගෙන නොතිබුණි. | වාර්තා එකිනෙකට පරස්පර වූ නිසා ඒ පිළිබඳව විමසීමට කටයුතු කළ බව. | වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකරගත යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය (රා.ප.ච. 25/2014 සේවකයන්ද ඇතුළත්ව) පිළිවෙලින් 104 ක් හා 86 ක් වූ අතර සේවක අතිරික්තතා 20 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉතිරි තනතුරු විධිමත් කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |